කොලොන්න ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 21 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද ඖෂධ වටිනාකම රු. 287,815 ක් වුවද, සාවද්‍ය ලෙස ජ'නල් සටහන් මඟින් නැවත රු. 197,743 ක් වියදමට ගලපා තිබුණි.

(ආ) ඖෂධ ආධාර වශයෙන් ලද රු. 273,600 ක් වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම් රු. 1,959,721 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව රු. 605,800 ක්වූ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු, රු. 505,300 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) වැඩ සටහන් අංක 02 යටතේ වන බලපත්‍ර ගාස්තු ආදායම් රු. 328,750 ක් වුවද, එය රු. 384,250 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි වලට අදාල ප්‍රාග්ධන ලැබීම් රු. 23,219,304 ක් වුවද, එය රු. 25,504,450 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) ප්‍රධාන ලෙජරයේ මුදල් ගිණුම් අනුව බැංකු ශේෂය රු. 915,726 ක් වුවද, බැංකු සැසඳුම අනුව මුදල් ශේෂය රු. 727,793 ක් වූයෙන් වෙනස රු. 187,933 ක් විය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 10 කට අදාලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර වෙනස රු. 2,370,142 ක් විය.

1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

රත්නපුර දිස්ත්‍රික්කයේ නාය යෑම වැළැක්වීම හා අවම කිරීමේ ක්‍රියාමාර්ග තුලින් ජනතාවට හා දේපල වලට සිදුවිය හැකි හානිය අවම කර ගැනිම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2011 පෙබරවාරි 10 දිනැති අංක ජා.ගො.ප.ස.2011/1 චක්‍රලේඛයේ දිනෙන් පසුව සිදු කරනු ලබන්නා වූ කවර හෝ ඉදි කිරිමක් සිදු කිරිමට හා එකී අවසරය ලබා දිමට පෙර අදාල පළාත් පාලන ආයතනය විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂන සංවිධානය වෙතින් යෝග්‍යතා සහතිකය ලබා ගත යුතු වුවත් මෙම සීමාව තුල ඉදිකිරිම් වලට අදාලව එපරිදි කටයුතු කර නොමැති බව අනාවරණය විය.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,099,507 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,182,843 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 2,282,350 කින් අඩුවී තිබූ අතර, එය සියයට 192 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන ආදායම් වැඩිවීමට වඩා වැඩි වේගයකින් පුනරාවර්ථන වියදම් වැඩිවීමකි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 1,157 | 1,035 | 308 |
| බදු කුලී | 4,408 | 2,962 | - |
| බලපත්‍ර ගාස්තු | 758 | 384 | - |
| වෙනත් ආදායම් | 5,883 | 2,296 | 1,067 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බදු කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු හා වෙනත් ආදායම් වල ඇස්තමේන්තුගත ආදායමට වඩා රැස්කල අදායමෙහි පිළිවෙලින් සියයට 14, සියයට 32, සියයට 55, සියයට 71 හා සියයට 51 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

--------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඇතැම් ප්‍රදේශ සීඝ්‍ර දියුණුවකට ලක්වී තිබුණද, එකී ප්‍රදේශ විධිමත් පරිදි හදුනාගෙන ඒවා දියුණු ගම් ප්‍රදේශ ලෙස නම් කර එකී කලාප වලින් වරිපනම් බදු අයකර ගැනීම සඳහා වූ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3.4 බිම් බදු

---------

සූරිය කන්ද කඩකාමර වලට අදාලව බදුකරුවන් 11 දෙනෙකු ගෙන් රු. 15,408 ක හිඟ බිම් බදු 2015 ජූලි මස වනවිටද අයකර ගෙන නොතිබුණි.

2.3.5 බලපත්‍ර ගාස්තු

----------------

බලපත්‍ර ගාස්තු අයකර ගතයුතු ව්‍යාපාර හදුනා ගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් විගණිත දිනය වූ 2015 ජූලි 17 දින වනවිටත් සිදුකර නොතිබූ අතර, එම බදු වලට අදාලව ආදායම් ලේඛණ නඩත්තු කිරීම සභාවට එකතුවන ආදායම මත පමණක් සිදු කර තිබුණි.

2.3.6 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙන් අනතුරුව ආරම්භ කල උල්ලිදූවාව සතිපොල මේ වනවිට නොපැවැත්වෙන බැවින් එමඟින් සභාව වෙත කිසිදු ආදායමක් නොලබන බව අනාවරණය විය.

(ආ) සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ ගාල් විධිමත් කිරීමේ නාම පුවරු සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 14,000 ක් වැය කර තිබුණද, ප්‍රදේශයේ පවතින ක්‍රමානුකූල නොවූ ත්‍රීරෝද රථ ගාල් අවශ්‍ය පහසුකම් සපයා දීමෙන් අනතුරුව අතුරු ව්‍යවස්ථා පනවා වාර්ෂිකව හෝ මාසිකව ආදායමක් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් 2014 අගෝස්තු මාසයෙන් පසු කාල සීමාවට අදාලවද, රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් 2014 පෙබරවාරි මාසයෙන් පසු කාල සීමාවට අදාලවද මුද්දර ගාස්තු සභාව වෙත ලැබී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක සිට සභාව විසින් ලබා දී තිබූ එකතුව රු. 925,155 ක්වූ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිටි එහෙත් දැනට සේවයේ නොමැති සේවකයින් 04 දෙනෙකුගේ එකතුව රු. 30,831 ක්වූ සේවක ඇප විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 ජූලි මස වනවිටද සභාව වෙත රඳවාගෙන තිබුණි.

(ඇ) සභාව සතු වාහන සඳහා ගරාජ පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා සභා භූමියේ තැනින් තැන ගාල්කර පවතින බැවින් ඒවායේ පැවැත්ම පිළිබඳ ගැටළු ඇතිවීමේ අවදානමක් පැවතින.

3.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

දැනට භාවිතා නොකර කාර්යාලය පිටුපස නවතා ඇති ට්‍රැක්ටර් ට්‍රේලරයක් දිරා යාමේ අවදානමට ලක්ව තිබුණි.

4. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය